# මාධ්‍යමික දර්ශනාගත මූලික ඉගැන්වීම් පිළිබඳ අධ්‍යයනයක්

සහය කථිකාචාර්ය
රාජකීය පණ්ඩිත පනාමුරේ චන්දිම හිමි

මාධ්‍යමික දර්ශනය හෙවත් මැද මාවත ඉස්මතු කර ගැනීම සිදු කරනු ලැබුයේ ආචාර්ය නාගාර්ජුන පාදයන් විසිනි. උන්වහන්සේ මුල මාධ්‍යමික කාරිකාවෙන් සිය දර්ශනය ඉස්මතු කොට දැක්වූහ. මෙහි ප්‍රධාන ඉගැන්වීම් සමුදායක් දැකගත හැකි අතර එම සියල්ලෙන් අවධාරණය කෙරෙනුයේ ශූන්‍යතා සංකල්පයයි. එයින් අපේක්ෂා කළේ සර්ව දෘෂ්ටි ප්‍රහානය කිරීමයි. මේ අභිප්‍රේතාර්ථය සාධනය කරගැනීමට නාගර්ජුන හිමියෝ අපෝහන තර්ක ක්‍රමය භාවිත කළහ. අන්‍ය මිත්‍යාදෘෂ්ටි මත විවේචනය කිරීමක් මිස ස්වමතයක් ස්ථාපනය කරන බවක් දක්නට නැතැයි ඇතැමෙක් කියති. එසේ වුව ද මාධ්‍යමික කාරිකාවේ දෙවන ශ්ලෝකය මුල්කොටගෙන ස්වමතයක් ස්ථාපනය කරන්නේ යැයි ද ප්‍රකාශ කිරීමට උත්සාහ ගෙන තිබේ. අභිධර්ම ඉගැන්වීම් මුල්කොටගෙන ඉස්මතු වූ ස්වභාව වාදය ප්‍රතික්ෂේප කිරීම ද මාධ්‍යමික දර්ශනයේ එක් අරමුණක් විය[1].

මාධ්‍යමික දර්ශනයේ මූල මාධ්‍යමික කාරිකාව මුඛ්‍ය ග්‍රන්ථය විය. එහි පරිච්ඡේද 27 කි. ශ්ලෝක 448 කින් ද යුක්ත විය. කච්චායන ගොත්ත සූත්‍රය (සංයුත්තනිකාය) මුල්කොටගෙන මෙය විරචිත බව මෙහි දක්වෙන ශ්ලෝකවලින් ම ඉදිරිපත්කර ඇත[2].

චතුෂ්කෝටිය, සංවෘති හා පරමාර්ථ සත්‍යය, ප්‍රතීත්‍ය සමුප්පාදය, නිවන හා සසර, භාව අභාව යන ඉගැන්වීම් මාධ්‍යමික දර්ශනයේ විශේෂ ස්ථානයක් ළඟා කර ගන්නාවූ ඉගැන්වීම් ය. මේ සියලු ඉගැන්වීම් ශූන්‍යතාව අර්ථවත් කරන ඒවාය. ආත්ම වශයෙන් ද ස්ව ලක්ෂණ වශයෙන් ද ස්වතන්ත්‍ර වශයෙන් ද ගතහැකි කිසිවක් සංඛත අසංඛත යන උභයලෝකයේ ම නොමැති බව මාධ්‍යමික දර්ශනයෙන් විස්තර වේ.[3]

මධ්‍යමික දර්ශනයේ පසුබිම යටතේ සාකච්ඡා කළ බෞද්ධ අබෞද්ධ සාධක හේතුකොට ගෙන ඇත නැත යන අන්ත දෙකට නො වැටී උභයාන්තය ප්‍රතික්ෂේප කිරීමක් දැකිය හැකිය. මාධ්‍යමික ඉගැන්වීම් අතර දක්නට ලැබෙන චතුෂ්කොටියෙන් පැවති අන්තගාමී අදහස් හා තර්කයන් සියල්ල ප්‍රතික්ෂේප වෙයි. ඉන්දිය ජාතික මතිලාල් ප්‍රකාශ කරන පරිදි චතුෂ්කෝටියෙන් ඉදිරිපත් කරනුයේ අවාච්‍ය තත්ත්වයක් බවයි. ව්‍යවහාරික ලොව තුළ පවතින යමක් සෘජුව ප්‍රකාශ කළ හැකිය. එසේ නොමැති අධිභෞතික ඥානය ප්‍රකාශ කිරීමට සුදුසු ම මාර්ගය චතුෂ්කෝටිය බවයි. ඔහුගේ මතය,

"තිෂ්ඨවාතොපි භගවාන් - භවතීත්‍යෙව නොහ්‍යතෙ
න භවත්‍යුභයං චෙති - නොභයං චෙති නොහ්‍යතෙ"[4]

"බුදුරජාණන් වහන්සේ නිවනෙන් පසු සිටීද, නො සිටීද, සිටින අතර ම නොසිටියි, සිටින්නේ ද නො වේ, නො සිටින්නේද නො වේ"

මෙම අදහසට අනුව ස්වයං විසංවාදීත්වය එක ම තර්කය තුළ යොදා ගැනීමෙන් බලාපොරොත්තු වන්නේ සීමිත සීමාවක පවතින භාෂාව ඉහත කරුණු විවරණය කිරීමට සප්‍රමාණ නොවන බවයි. මෙමඟින් අධිභෞතිකත්වයක් හිසමත පටවන්නට උත්සාහ නො කරන අතර ස්ඵුට කිරීමට වෙහෙසෙන්නේ ලොව පවතින සියල්ලෙහි ශූන්‍යතත්ත්වයයි. මෙසේ චතුෂ්කෝටිය භාවිත කිරීමෙන් නාගර්ජුනපාදයෝ බලාපොරොත්තු වන්නට ඇත්තේ පුද්ගලයාගේ දෘෂ්ටි ප්‍රහාණය පමණක් විය යුතුය.

මුල් බුදුසමයේ සූත්ත නිපාතයේ අට්ඨක වග්ගයේ මහාව්‍යූහ සූත්‍රයේදී ''සම්මුතියො පුථුජ්ජා'' ''පරමත්ථපසන්තියා'', යන යෙදීම දක්නට ලැබේ[5]. එසේ ම දීඝනිකායේ 'පොට්ඨපාද' සූත්‍රයේ දී "" නාහං භික්ඛංව ලොකෙන විවදාමි, යං භික්ඛවෙ අත්ථීති සම්මතං ලොකෙ පණ්ඩිතානං අහම්පි තං අත්ථීති වදාමි යං භික්ඛවෙ නත්ථීති සම්මතං ලොකේ පණ්ඩිතානං අහම්පි තං නත්ථීති වදාමි"[1] මෙසේ සම්මතය පිළිබඳ හෝ පරමාර්ථය පිළිබඳ හෝ දැඩි එල්බ ගැනීමක් බුදුරදුන් තුළ නොවූ බව පැහැදිලි ය. මෙම පරමාර්ථ හා සම්මුති යන උභය සත්‍යය පිළිබඳ ඉගැන්වීම නාගර්ජුන පාදයන්ගේ ද මූලික විෂයක් විය.

ශූන්‍යතාවය ඉදිරිපත් කරමින් සියල්ල ශූන්‍ය බව ප්‍රකාශ කළ නාගර්ජුන දර්ශනයට ප්‍රතිවිරෝධතා රැසක් එල්ල විය. ඒ අනුව සියල්ල ශූන්‍ය නම් බුදුදහමේ ඉගැන්වෙන චතුසත්‍යයද ශූන්‍යය, පටිච්ච සමුප්පදාය ද, ආචාරධර්ම ද ත්‍රිවිධ රත්නය ද, බුද්ධෝත්පාදය ද, බුදුකෙනකුගේ ක්‍රියාවන් ද යන සියල්ල ශූන්‍ය විය යුතුය යැයි චෝදනා කළහ. මෙම විරෝධතාව හමුවේ නාගර්ජුන හිමියෝ පරමාර්ථ සත්‍යය හා සම්මුති සත්‍යය යන උභය සත්‍යය පිළිගෙන ඒ පිළිබඳ ඉගැන්වීම් ඉදිරිපත් කරති.

ද්වෙ සත්‍යෙ සමුපාශ්‍රිත්‍ය - බුද්ධානාං ධර්ම දේශනා
ලොක සංවෘති සත්‍යංච - සත්‍යංච පරමාර්ථත[7]

ව්‍යවහාරය පසෙකලා පරමාර්ථය කතාකළ නො හැකි බවත් ව්‍යවහාරය (සංවෘති) මඟින් ම පරමාර්ථය සාධනය කළ යුතු බවත් නාගර්ජුන පාදයෝ ප්‍රකාශ කරයි.

ව්‍යවහාර මනාශ්‍රිත්‍ය - පරමාර්ථො න දෙශ්‍යතෙ
පරමාර්ථ මනාගම්‍ය - නිර්වාණං නාධිගම්‍යතෙ[8]

මෙම අදහසට අනුව ව්‍යවහාර සත්‍යයෙන් තොර පරමාර්ථයක් හෝ පරමාර්ථයෙන් තොර නිර්වාණයක් හෝ නොමැති බව ප්‍රකට වේ. මෙම තත්ත්වය අවබෝධ නො කරගෙන ශූන්‍යතාව ග්‍රහණය කරගන්නා තැනැත්තා වැරදි ලෙස සර්පයකු අල්ලා ගත්තා සේ හැඳින් විය හැකිය. මෙම අදහස මජ්ඣිම

නිකායේ අලගද්දූපම සූත්‍රයේ අදහසට ද එහි එන උපමාවට ද සමාන වේ.[9] මෙසේ මුල් බුදුසමයේ දැක්වූව ද අංගුත්තර නිකායට්ඨකථා වේ.

"දුවෙ සච්චානි අකඛාසි - සම්බුදෙධා වදතං වරො
සම්මුතිං පරමත්‍ථං ච - තතියං අනුපලබ්භති[10]

මාධ්‍යමික කාරිකාවේ 24 පරිච්ඡේදයේ දසවන ශ්ලෝකයෙන් දක්වන පරිදි පරමාර්ථය සමඟ යෙදෙනුයේ ව්‍යවහාරයයි. ව්‍යවහාරය නම් භාෂාවයි ලෞකික ලොව භාවිත සියල්ල භාෂාව මගින් ප්‍රකාශ කළා වූව ද පරමාර්ථය භාෂා මාධ්‍යයකින් ප්‍රකාශ කළ නො හැක. එමනිසා සත්‍යයේ ද තත්ත්වයන් (සම්මුති පරමාර්ථ) තිබිය යුතුය. මෙම භාෂාමය ගැටලුවේ දී සත්‍යය දෙකක් ලෙස සලකන අතර ඒ අනුව චතුරාර්ය සත්‍යය, පටිච්චසමුප්පාදය ආදිය ශූන්‍ය ලෙස බැලිය යුතු වන්නේ පරමාර්ථ සත්‍යයට අනුකූල ව ය. එසේ බලන විට ඒවායේ ශූන්‍යත්වය පිළිගත හැකි වේ.

මාධ්‍යමික දර්ශනයේ දී නාගර්ජුන හිමියෝ ආත්මදෘෂ්ටිය ප්‍රහානය කරනුයේ නිත්‍ය වූ ආත්ම වශයෙන් ගතයුතු කිසිවක් නැතැයි කියති. මෙම අදහස් දැක්වීම මත නාගර්ජුන නාස්තිකවාදියකු නො වේ. ඒ බව ශූන්‍යතාව නිසි අධ්‍යයනයකට හසුකර ගැනීමෙන් ස්ඵුට වේ.

මාධ්‍යමික ඉගැන්වීම් අතර සසර සහ නිවන සංකල්ප යද සුවිශේෂී ස්ථානයක් ලබයි. සසර භාව වේ. සසර නැතිකිරීමෙන් ඇතිවන නිවන අභාසයක් වශයෙන් සැලකීම සාවද්‍යය. මාධ්‍යමික ඉගැන්වීමට අනුව නිවන භාව හෝ අභාව නො වේ.

භාවනශ්ච යදි නිර්වාණං - නිර්වාණං සංස්කෘතං භවෙත්
නාසංස්කෘතෙ හි විද්‍යතෙ - භාවෘත්වචන තශ්වන[11]

"නිවන භාව වේ නම් එය සංස්කෘත දෙයක් විය යුතුය. නිවන අභාවයක් නම් කිසිදු තැනක නොමැති විය යුතුය." එනිසා ඒ නිවන භාව හෝ ආභාව නො වේ. නිර්වාණය පැහැදිලි කරන්නට තරම් බස පුළුල් නො වේ. එහෙයින් ම ව්‍යවහාර භාෂාව නිර්මාණය

ඍජු ව හැඳින්වීමට යම් යම් වචන භාවිත කරයි. ඒවා සප්‍රමාණ නොවේ.

සසර සහ නිවන අතර සියුම් වෙනසක් හෝ නො පවතී.

නිර්වාණස්‍ය යාකොටිඃ- කොටිඃ සංසාරණස්‍ය ච
න තයෝරන්තරං කිඤ්චිත් - සුක්ෂ්මපි විද්‍යතෙ[12]

යම් ආකාරයකින් ඉන්දනවලින් තොරව ගින්නක් ගැන හෝ ගින්නකින් තොර ඉන්දන ගැන හෝ කථා කළ නොහැක. ඒ දෙකම සාපේක්ෂ ව පවතී. සසර නිවන ද එසේ ම ය.

න සංසාරස්‍ය නිර්වාණාත් - කිඤ්චිත් දස්ති විශේෂණම්
න නිර්වාණස්‍ය සංසාරාත් - කිඤ්චිදස්ති විශේෂණම්[13]

මෙම සසර නිවන පිළිබඳ ව ද, සම්මුති පරමාර්ථ පිළිබඳ ව ද චතුෂ්කෝටිය පිළිබඳ ඉගැන්වෙන මාධ්‍යමක දර්ශනය ඒ සියල්ලෙන් අර්ථ ගන්වන්නට උත්සාහ කරනුයේ ශුන්‍යතාවයි.

## මාධ්‍යමක ශුන්‍යතා සංකල්පය

මාධ්‍යමක දර්ශනයේ හරය ශුන්‍යතාවයයි. මෙය අවබෝධ කරගැනීම ප්‍රඥාව වශයෙන් හඳුන්වනු ලබයි. ප්‍රඥා පාරමිතා සූත්‍රයේ දී,

සුඤ්ඤත

අනිමිත්ත

අප්පණිහිත

යන ත්‍රිවිධ භාවනා වැඩීමෙන් ප්‍රඥාව හෙවත් ශුන්‍යතාව අවබෝධ කළ හැකිය. ප්‍රඥා පාරමිතා සූත්‍ර දක්වන ආකාරයට ප්‍රඥාව දෙයකාර වේ. පරමාර්ථ ප්‍රඥාව ශුන්‍යතාව අවබෝධයයි. සම්මුති ප්‍රඥාවේ දී සිදුවන්නේ ව්‍යවහාර ලෝකයේ අවශ්‍යතා සඳහා ප්‍රඥාව ලබා ගැනීම පමණි. සියුම් වූ පරමාර්ථ ප්‍රඥාවේ දී, ධර්මයන් පිළිබඳ යථා ස්වභාවය නිර්විකල්ප ඥානයෙන් අවබෝධ කරගත යුතුය. එහි දී සියලු සංකල්ප අතහැරිය යුතුය.

ථෙරවාදී ඉගැන්වීම්වලට අනුව ආත්ම දෘෂ්ටියෙන් දුරුවීම ශූන්‍යතාවයයි. (සුඤ්ඤමිදං භික්ඛවෙ අත්තෙනත්වා අත්තනීයෙනත්වා)[14] සංයුත්ත නිකායේදී ඒ අයුරින් ද සුත්ත නිපාතයේ දී අත්තානු දිට්ඨිං ඌහච්ච එවං මච්චුතරොසියා වශයෙන් දක්වයි. මෙමගින් අවධාරණය කරනුයේ ආත්ම දෘෂ්ඨිය උදුරා දමන ලෙසයි. එකල මාරයාගෙන් මිදිය හැකිය. මෙය සස්ථිර කරමින් ථෙරවාදී පඬිවරු පුද්ගල ශූන්‍යත්වය සෙවූහ. ස්කන්ධ ධාතු ආයතන වශයෙන් ද රූප හා නාම වශයෙන් ද උපරිමාර්ථය කරා විශ්ලේෂණය කරමින් ආත්ම වශයෙන් ගතහැකි පුද්ගල ස්වභාවයක් නැතැයි පුද්ගල නෛරාත්මය ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටියහ.

මහායානිකයෝ පුද්ගල නෛරාත්මය පමණක් නොව ධර්මයෝ ද ශූන්‍ය බව පෙන්වා දෙති. පටිච්ච සමුප්පාදය ඉවහල් කරගනිමින් සියලු සංස්කෘත ධර්ම ශූන්‍ය යැයි පවසති. එතෙකින් නො නැවතී අසංස්කෘත ධර්ම ද ශූන්‍යයැයි දක්වති. ඒ අනුව නිර්වාණය ද ශූන්‍යය. ආත්ම දෘෂ්ටිය ප්‍රතික්ෂේප කිරීමට සුදුසු ම දෝෂ අවම වූ වචනය ශූන්‍ය යන්න යැයි විද්වත්හු ප්‍රකාශ කරති. එහෙත් නො වෙනස්වන දෙයක් ලොව නොමැත. සියල්ල වෙනස් වන සුලු ය. චලන සෙලවෙන සුලු ය. ස්ථිර නොවෙනස් යමක් අවබෝධ කරගැනීම අපහසු ය. අවබෝධ වන්නේ වෙනස්වන, අස්ථිර දේ පමණි. නිවන ද අස්ථිර වූවක් නිසා අවබෝධ වේ. එනිසා නිවන ද ශූන්‍යය. සංඛත ලොව ත්‍රිලක්ෂණය යම් සේ සාපේක්ෂ ද නිවන ද ත්‍රිලක්ෂණයට සාපේක්ෂක ය.[15]

මාධ්‍යමක ශූන්‍යතා දර්ශනය පටිච්ච සමුප්පාදය මුල්කොට පවතී.

යඃ ප්‍රතීත්‍ය සමුත්පාදඃ- ශූන්‍යතාං තාං ප්‍රචක්ෂ්මහෙ
සා ප්‍රඥප්ති රූපාදාය - ප්‍රතිපත්සෙව මධ්‍යමා[16]

මෙම ප්‍රකාශයට අනුව ප්‍රතීත්‍ය සමුත්පාදය ද, මධ්‍යම ප්‍රතිපදාවද, ශූන්‍යතාවද සමාන වෙති. ශූන්‍යතාවයේ ප්‍රභේද රාශියකි. මුඛ්‍ය ලෙස ම

1. ප්‍රපංච ශූන්‍යතාව
2. ප්‍රඥා ශූන්‍යතාව
3. තථාගත ශූන්‍යතාව

වශයෙන් හැඳින්විය හැකිය. මෙම ශූන්‍යතා සාධනය කරනුයේ ප්‍රතීත්‍ය සමුත්පාදය මගිනි. මෙහි දී ප්‍රතීත්‍ය සමුත්පාදය පිළිබඳ පැවති මුල් මත සතරක් ප්‍රතික්ෂේප වී යයි. ඒවා නම්

1. ස්වත උත්පත්ති
2. පරත උත්පත්ති
3. ද්වාභ්‍යා උත්පත්ති
4. අහේතු උත්පත්ති යනුයි.

"න ස්වෙතො නාපි පරතො - න ද්වාභ්‍යං තාප්‍ය හේතුත
උත්පත්තා ජාතු විද්‍යන්තෙ - භාවාඃක්වචන කේචන[17]

මෙම අදහස බුදුරජාණන් වහන්සේ ද 'අචෙලකස්සප' සූත්‍රයේ දී ප්‍රතික්ෂේප කර ඇති අතර නාගර්ජුන හිමියෝ ද මෙම මත සතර ම බැහැර කරමින් පටිච්ච සමුප්පාදය තුළ ශූන්‍යත්වය පමණක් විද්‍යමාන බව පවසති. ලොව කිසිවකු භාව හෝ අභාව ද ස්වත හෝ පරත ද දකින්නට නොමැති අතර සියල්ල යනු තර්ක මගින් ගොඩනගාගත් සංකල්පයෝ පමණකි. මෙම සංකල්පය තුළ ස්වාධීන, ස්වතන්ත්‍ර හේතු ස්වෛරී කිසිවක් දැකගත නො හැකිය. ඒ සියල්ල පරස්පර අපේක්ෂාවෙන් සිටී. මේ හේතුව නිසා පටිච්ච සමුප්පාදය සාපේක්ෂතාවයක් ඉදිරිපත් කරන්නේ යැයි ප්‍රකාශ කිරීම යුක්ති යුක්ත ය. මෙම සාපේක්ෂක බව නිසා ආත්ම ලක්ෂණ සියල්ල ශූණත්වයට පත් වෙයි. ලොව සියල්ල ශූන්‍යය අසංඛත වූ කිසිවක් ලොවේ නො වේ.

ලොව සියල්ල සාපේක්ෂකත්වය නිසා පවතින බව උගත්තෙමු. රාත්‍රිය ඇති නිසා දහවල ඇත. උස ඇතිවීම නිසා මිටි බව ඇත. කළු පැවතිය නිසා සුදු ඇත. මේ අයුරින් පරස්පර අපේක්ෂාවෙන් ලොව සියල්ල පවතින්නේ යැයි අවබෝධ කිරීමෙන් ශූන්‍යතාවය හෙවත් ප්‍රඥාව වර්ධනය වේ. එම ශූන්‍යතාවයේ ප්‍රභේද

පිළිබඳ ව ද උගත්තෙම් එක් එක් කොටස සංක්ෂිප්ත ව විමසා බැලීම වටී.

ප්‍රථමයෙන් ම ප්‍රපංචවල ශූන්‍යතාව විමසීම වැදගත් වෙයි. ඉන්ද්‍රිය ගෝචර වූ ද අතීන්ද්‍රිය ගෝචර වූ ද සියලු බාහිර ලෝකයේ පැවැත්ම ප්‍රපංච වශයෙන් සලකයි. මේවා කෙරෙහි ස්වාධීනත්වයක් වූ බවක් විද්‍යමාන නො වේ. එම කරුණු නිසා සංස්කාර සියල්ල ශූන්‍යය යැයි අවබෝධ කරගත යුතුය.

ප්‍රඥා ශූන්‍යතාව යනු පරමාර්ථ සත්‍යාවබෝධය ද ශූන්‍ය බවයි. පරමාර්ථ සත්‍යාවබෝධය නම් ලොව සියල්ල ශූන්‍ය බව වටහා ගැනීමයි. සංස්කෘත අසංස්කෘත සියල්ල ශූන්‍ය වේ යන අවබෝධය ලබාගන්නා නිර්වාණාවබෝධය ලැබූ පුද්ගලයා ය. ඔහු ලෝකය පිළිබඳ ගොඩ නගාගත් සියලු සංකල්ප නිරෝධ කරයි. ධර්ම අධර්ම සියල්ලෙන් නිදහස්වීම ප්‍රඥාවයි. මෙසේ අවබෝධ කරගන්නා වූ නිර්වාණය ද සංකල්ප නිරෝධය ද ශූන්‍යයැයි සිතීම ප්‍රඥා ශූන්‍යතාවයයි.

ප්‍රඥා ශූන්‍යතාව ලබාගන්නා වූ තථාගතයාණන්ගේ ශූන්‍යතාවය හෙවත් ස්වෛරී බවක් නොමැති බව අවබෝධ කරගැනීම තථාගත ශූන්‍යතාවයයි.

මෙම ඉගැන්වීම්වලට අනුව සාපේක්ෂක ලෝකය පමණක් නොව අසංස්කෘත වූ ධර්මයන් ද බහා තැබිය යුතුය. පටිච්ච සමුප්පාදය චතුරාර්ය සත්‍යය, ත්‍රිලක්ෂණය යන මේවායේද 'අත්ත' වශයෙන් හෝ 'අත්තනීය' වශයෙන් ගතයුත්තක් නො පෙනෙයි. මෙම කරුණු සාධනය කිරීමෙන් ධර්මය ද ආත්ම තත්ත්වය ප්‍රතික්ෂේපකර පවතින්නක් බව පෙනෙන්නට තිබේ. මාධ්‍යමක දර්ශනයේ ධර්ම නෛරාත්ම්‍යය විශේෂ ඉගැන්වීමකි. ථෙරවාදීන් ඇතුලු පිරිස් පුද්ගල නෛරාත්ම්‍ය පමණකි යන අදහසින් සිටි අතර ධර්ම නෛරාත්ම්‍යය ද පුද්ගල නෛරාත්ම්‍යය තත්ත්වය සේ ම අවබෝධ කටයුතු යැයි අවධාරණය කරනුයේ මාධ්‍යමිකයන් විසින් ය.

ඉහත අදහස ප්‍රතීයමාන කරන්නාවූ ශ්ලෝකයක් මාධ්‍යමික කාරිකාවෙන් හමුවේ.

ශූන්‍යතා සර්ව දෘෂ්ටීනාං - ප්‍රොක්තා නිශ්ශරණං ජිනෛඃ
යෙශාංතු ශූන්‍යතා දෘෂ්ටිඃ - තානසාධ්‍යන් බභාපිරෙ[18]

ශූන්‍යතාව යනු සියලු දෘෂ්ටීන්ගෙන් මිදීම යැයි පඬිවරු කියති. එහෙත් ශූන්‍යතාව දෘෂ්ටියක් ලෙස ගත්තකු සුවකළ නො හැකි රෝගියකු වනු නො අනුමාන ය.

මේ කරුණු අනුව මාධ්‍යමක ශූන්‍යතා සංකල්පය යනු සියල්ලක් දෘෂ්ටි ග්‍රහණයෙන් මිදවීමයි. පුද්ගල දෘෂ්ටිය, ප්‍රපංචදෘෂ්ටිය, ධර්ම දෘෂ්ටිය, තථාගත දෘෂ්ටි මේ සියල්ලක් විනාශකොට ශූන්‍යතාවය ද දෘෂ්ටි ග්‍රහණයෙන් තොරව අවබෝධනය කිරීමයි. ඊශ්වර නිර්මාණයන් හෝ පදාර්ථවාදී භෞතික නිගමනයක් හෝ සත් අසත් කිසිවක් හෝ ලොව නැත. ඒ කිසිවක ස්ථිර වූ නිත්‍ය වූ ස්වාධීනවූ තත්ත්වයක් විද්‍යමාන නො වෙයි. සියල්ල තුළ ඇත්තේ භාව තත්ත්වය ද නොව අභාවය ද නොව නිස්වභාවයයි. එනම් ස්වාධීන ස්වතන්ත්‍ර ස්වෛරී බවක් නොමැති වීමයි.

## අන්තික සටහන්


01. තිලකරත්න අසංග, ශූන්‍යතාවාදයෙහි දර්ශනය සහ චරණය, තිවිර ප්‍රකාශනය, 2001. 73 පිටුව

02. සාසනරතන හිමි, මොරටුවේ, මාධ්‍යමික දර්ශනය, ප්‍රකාශනය ශ්‍රාවන්ති, 1970.

03. එම

04. එම 25 පරි 18 ශ්ලෝකය

05. සුත්ත නිපාතය අට්ඨක වග්ගය, මහාව්‍යූහ සූත්‍රය, ත්‍රි. බු.ජ.මු.

06. දීඝනිකාය පොට්ඨපාද සූත්‍රය,350 පිටුව, ත්‍රි.බු.ජ.මු.

07. සාසනරතන හිමි, මොරටුවේ, මාධ්‍යමික දර්ශනය, ප්‍රකාශනය ශ්‍රාවන්ති, 1970.24 පරි. 8 ශ්ලොකය

08. එම- 24පරි 10 ශ්ලෝකය

09. මජ්ඣිමනිකාය, අලගද්දූපම සූත්‍රය, ත්‍රි.බු.ජ.මු.

10. අංගුත්තරනිකායට්ඨ කතාව

11. සාසනරතන හිමි, මොරටුවේ, මාධ්‍යමික දර්ශනය, ප්‍රකාශනය ශ්‍රාවන්ති, 1970.
12. එම
13. එම
14. සංයුත්ත නිකාය,
15. සාසනරතන හිමි, මොරටුවේ, මාධ්‍යමික දර්ශනය, ප්‍රකාශනය ශ්‍රාවන්ති, 1970.
16. එම
17. එම
18. එම